www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාකයේ මරාගෙන මැරෙන බෝම්බ ව්‍යාපාරය: අධිරාජ්‍යවාදයට එරෙහි දේශපාලන අරගලයෙන් ප්‍රතිගාමී පීලිපැනීමක්

**Iraq suicide bombing campaign:**
**A reactioary diversion from the political struggle against imperialism**

**ලෝසවෙඅ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල ප්‍රකාශනය**
**2005 මාර්තු 04**

පසුගිය සඳුදා ඉරාකයේ හිල්ලා නගරයේ දී පිපිරවූ මරාගෙන මැරෙන කාර් බෝම්බ ප්‍රහාරය, දෙවසරකට පමන පෙර සදාම් හුසේන් තන්ත්‍රය පෙරලාදැමූ ඇමරිකා එක්සත් ජනපද ආක්‍රමනයේ පටන්, එවන් එක් සිද්ධිකයකදී වාර්තාවූ වැඩි ම ජීවිත හානිය සිදු කලේ ය. එම පිපිරවීම එල්ල කර තිබුනේ ඇමරිකා එක්සත් ජනපදය සංවිධානය කල ඉරාක පොලීසියට හා හමුදාවට බැඳීම සඳහා අවශ්‍ය වෛද්‍ය පරීක්ෂන බලාපොරොත්තුවෙන් සිටි තරුනයන් වෙත ය. මාර්ගයේ ගමන් කරමින් සිටි හා අසල වෙලඳපොලෙන් බඩු මිලදී ගනිමින් සිටි මිනිසුන් ද ඇතුලුව ප්‍රහාරයට ගොදුරු වූවන්ගෙන් 125 දෙනෙක් පමන මියගොස් අවම වසයෙන් 130 කට වැඩි පිරිසක් තුවාල ලැබූහ.

ෂියාවරුන් අතිමහත් බහුතරයක් ජීවත්වන හිල්ලා නගරයේ ප්‍රහාරය, පසුගිය දෙමස තුල වැඩීයමින් පැවතුනාවූ ත්‍රස්තවාදී ප්‍රහාරවැලක අලුත් ම හා ලේවැකිම ප්‍රහාරය යි. *ඇසෝසියේටඩ් ප්‍රෙස්* වාර්තාකල ගනන් හිලව් අනුව ජනවාරියේදී වෙන් වෙන් ප්‍රහාරයන් 55 කින් පමන 234 දෙනෙක් මියගොස් 429ක් තුවාල ලැබූහ. පෙබරවාරියේදී එවන් ප්‍රහාර 38ක දී මරන සංඛ්‍යව 311 දක්වා ද තුවාලකරුවන් 433 දක්වා ද ඉහල ගියේ ය.

ජනගහනයෙන් බහුතරය දරිද්‍රතාවයෙන් ද විරැකියාවෙන් ද පෙලෙන රටක රැකියාවක් හා වැටුපක් අපේක්ෂාවෙන් පොලීසියට හා හමුදාවට බැඳෙන්නට පෙලඹී සිටින කම්කරු පන්තික තරුනයන් ද ඇතුලුව, සටන්කරුවන් නොවූ ඉරාකීයයන් මෙසේ අමුඅමුවේ ඝාතනය කිරීම, දේශපාලන අපරාධයක් ලෙස හෙලා දැකීමට පාත්‍ර විය යුතු ය.

මෙය හුදෙක් සදාචාරාත්මක කෝපය පිලිබඳ ප්‍රශ්නයක් නො වේ. මේවා දේශපාලන අපරාධයන් ය. ඉරාකයේ නීතිවිරෝධී ඇමරිකානු මිලිටරි ග්‍රහනය දුබල කිරීම වෙනුවට එවන් ප්‍රහාරයන්ගේ මූලික ප්‍රතිඵලය වන්නේ මහජනතාව කාන්ඩමික ගැටුම්වලින් බෙලහීන කිරීමට තුඩුදිය හැකි ගැඹුරු දේශපාලනික ව්‍යාකූලත්වයක් ඇති කිරීමට ය.

ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර කෙරෙහි වූ *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* විරුද්ධත්වය ද බුෂ් පරිපාලනය හා ඉරාකය තුල එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අපරාධයන් යුක්තිසහගත කිරීමේ එකම අරමුනෙන් යුත් මහා ව්‍යාපාරික මාධ්‍යයන් විසින් හිල්ලා හා ඊට සමාන බෝම්බ ප්‍රහාරයන් නරුම ලෙස හෙලාදැකීම් ද අතර, කිසිදු පොදු බවක් ඇත්තේ නැත.

ඉරාකයට එරෙහි එක්සත් ජනපද යුද්ධයේ ආරම්භයේදී ම එල්ල කල ලේවැකි ප්‍රහාරයන්ගෙන් පීඩාවිඳ තිබෙන හිල්ලා නගරය සමූලඝාතනයන්ට නුහුරු නොවන බව මතක් කර ගැනීමට කරදර වන්නේ අතලොස්සක් දෙනා පමනි. 2003 අප්‍රේල් 1 වැනි දින එක්සත් ජනපද මිලිටරිය නගරයට එල්ල කල පොකුරු බෝම්බවලින් මියගිය 60 ක් පමන දෙනාගෙන් බොහොමයක් ලමුන් වූ අතර තවත් සිය ගනනක් දෙනා තුවාල ලැබූහ. මෙම ආයුධය යොදා ගැනීම යනු පවත්වාගෙන යන්නාවූ සාපරාධී යුද්ධයකදී සිදු කෙරුනු තවත් යුද අපරාධයකි.

එක්සත් ජනපද ආක්‍රමනයේ පටන් මියගිය ලක්ෂගනනකගෙන් වැඩි ප්‍රමානයක් ඇතුලත් තමන්ගේ ම හමුදාවන් විසින් ගෙන ගිය මනුෂ්‍ය ඝාතන සම්බන්ධයෙන් පමනක් නොව ඉරාකය තුල සියලු ලේ හැලීම් සම්බන්ධයෙන් ම අවසානයේ දී වොෂින්ටනය වගකිව යුතු වෙයි. එක්සත් ජනපද හමුදා යටත් කිරීමක් පවත්වාගෙන යන්නාවූ බලයක් වන හෙයින් ජාත්‍යන්තර නීතියේ දෘෂ්ටිකෝනයෙන් මෙය අවිවාදාත්මකව සත්‍ය වේ. එහෙත් වඩාත් මූලිකව

සලකන කල විනාශකාරී ආර්ථික සම්බාධකවල දශකයක් අවසානයේ ඉරාක සමාජය නැතිභංගස්ථාන කල ඇමරිකානු යුද්ධය හා යටත් කිරීම, විරෝධතාවන් අවුලුවාලමින් ඉරාකය සමාජයීය හා ආර්ථික වසයෙන් බිඳ විසුරුවාලන තත්වයකට ඇද හෙලා ඇත.

කෙසේ වුව ද එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අපරාධ ඇමරිකානු මිලිටරි ග්‍රහනයේ විරුද්ධවාදීන් බවට නිසැකවන බොහෝ දෙනෙක් ද ඇතුලත් ඉරාක වැසියන් නිස්කාරනයේ ඝාතනය කරන්නාවූ උපක්‍රමයන් කිසි ලෙසකින් වත් යුක්ති සහගත නො කරයි.

විදේශීය මිලිටරි යටත් කර ගැනීමකට එරෙහි අරගලයේ දී සන්නද්ධ අරගලය යුක්ති යුක්ත හා නො වැලැක්විය හැකි උපායන් වන්නේ නමුදු එය අවසන් අරමුන නොවන අතර මහජනයා උගන්වාගන්නා වූ, මග පෙන්වන්වන්නා වූ, හා උද්වේග ගන්වන්නා වූ දේශපාලන ක්‍රියාමාර්ගයක තැන ගැනීමට ද එය සමත් නො වේ. තවද යොදාගන්නා මාධ්‍යයන් හා අවසාන අරමුනු අතර ප්‍රගාඪ සම්බන්ධයක් ඇත. අබුග්‍රයිබ්හි එක්සත් ජනපදය කරගෙන ගිය කාමාපරාධී භාවිතයන් මගින් ඉරාකය යටත් කර ගැනීමේලා පැවති තරයේ ම කොල්ලකාරීවූ අරමුනු ප්‍රකාශ වූ ආකාරයට ම, ඉරාකීයන් සමූහ වසයෙන් ඝාතනය කිරීමේ දී මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර සඳහා වගකිව යුතු දේශපාලන බලවේගයන්ගේ අවශ්‍යයෙන් ම ප්‍රතිගාමී වූ ඉදිරිදර්ශනය ද හෙලිදරව් කෙරෙයි. මෙම ප්‍රහාරයන් එල්ල කරනුයේ, ජනතාව විශේෂිත දේශපාලන පිලිවෙතකට දිනා ගැනීම සඳහා හෝ ඉරාකය තුල රැ දී සිටින එක්සත් ජනපදයේ විජිතකරන පිලිවෙත කෙරෙහි ජනතා විරෝධය පුබුදුවාලීම සඳහා බවට කිසිදු ඇඟවීමකින් පවා තොරව බව සැලකිය යුතු ය.

ඇල්ජීරියාව සම්බන්ධ ප්‍රශ්නයේ දී, ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර උපයෝගී කරගැනීම් ඇතුලුව මින්පෙර අවධියේ දී යටත්විජිත විරෝධී ව්‍යාපාරයන්හි අරගලයන්, අවිවාදිතව ම ප්‍රචන්ඩත්වය සමග බැඳී පැවතුනි. ජාතිකවාදයේ සියලු සීමාසහිතකම් හා මිථ්‍යාවන් තිබියදී ම මෙම අරගලයන්හි නිරතවූ ව්‍යාපාරයන් එම ක්‍රියාවල නිරතවූයේ සිය දේශපාලන ක්‍රියාමාර්ග හෝ ඉල්ලීම් මහජනතාව වෙත ඉදිරිපත් කරමින් ඔවුන්ගේ සහයෝගය දිනාගැනීමට ය.

එහෙත්, ඉරාකය තුල මෙම අපරාධකාර ක්‍රියා සංවිධානය කරන්නෝ පැතිර පවතින අතෘප්තිය හා දේශපාලන නොසංසුන්තාවයට ආමන්ත්‍රනය කිරීමක් හෝ සමස්තයක් වසයෙන් කලාපය පුරා ආධිපත්‍ය පතුරුවන එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට එරෙහි පුලුල් විරෝධයක් උපයෝගී කර ගැනීමක් හෝ, උදෙසා කිසිදු උත්සායක් නො දරති. ඒ වෙනුවෙන් ඔවුන්, තරුන තරුනියන්ගේ කෝපය, ස්වයං පරිත්‍යාගයේ ජීවගුනය හා පීඩාවට එරෙහිව ඇති අව්‍යාජ වෛරය ගසාකමින් අධම වික්‍රමයකට බිලිදීම සඳහා ඔවුන් නරුම ලෙස යොදා ගනිති.

මෙම ක්‍රමෝපායන් අධිරාජ්‍යවාදය පරාජය කිරීමේ අරගලයක් මත පදනම් නො වේ. ඒවා කරගෙන යනු ලබන්නේ ඉරාක මහජනතාව කෙරෙහි ද ඉරාක කම්කරු පන්තියේ ගැඹුරු ඓතිහාසික සම්ප්‍රදායන් කෙරෙහි ද පවත්නා පිලිකුලෙන් යුතුව ය. එවැනි දේ සේවය කරන්නේ සමාජ සවිඥානකම පිරිහෙලීමටත් දේශපාලන ව්‍යාකූලතාවය වැපිරීමටත් ය.

ඉස්ලාම් වෙබ් අඩවියක් වාර්තා කලේ ඉරාකයේ ශුද්ධවූ යුද්ධයක් සඳහා ඇල්කයිඩා සංවිධානය ලෙස තමන්ව හඳුන්වාගන්නා කන්ඩායමක් හිල්ලා බෝම්බ පිපිරවීමේ වගකීම බාරගෙන ඇති බවයි. මෙම සංවිධානය නමට පමනක් සීමාවූවක් ද යන්න පවා පැහැදිලිකමෙන් තොර ය.

අහමඩ් චලාබි හා ඉයාඩ් අල්ලාවි වැනි ඇමරිකානු ගැත්තන්ට හිතවත් බලවේගයන්, තමන් ඉවත් කර තැබෙන ආන්ඩුවක් ගොඩනැගීප්ම වැලැක්වීමේ අරමුනෙන්, තමන් යැපෙන්නාවූ එක්සත් ජනපද මිරිටරි පාලනයේ පැවැත්ම සඳහා, යුක්තිකරනයක්, සම්පාදනය කිරීමට, මෙවැනි ප්‍රකෝපකාරී ක්‍රියාවන්හි යෙදුනේය යන්න ද බැහැර කල නොහැකි ය.

එවැනි ත්‍රස්තවාදී බෝම්බ පිපිරවීම්වල ස්වභාවය නිසාම, එහි සංවිධායකයන් හරියාකාරව හඳුනාගැනීම ද, ඔවුන්ගේ දේශපාලන අරමුනුවල ස්වභාවය ද, මුලුමනින් ම ප්‍රත්‍යක්ෂ කරගත නොහැක. සීඅයිඒ සංවිධානයමත් ඇතුලත් වන තම සැඟවුනු න්‍යායපත්‍රයන් සහිත කොටස් කිසිදු නොවපතින සංවිධානයක නාමයෙන් මෙවන් බෝම්බ පිපිරවීම් සිදු කිරීමට ඉඩ තිබේ.

එසේම මෙවන් ක්‍රමොපායන්, ඉස්ලාමීය බලවේගයන්ට හෝ ඉරාක බාත්වාදී පාලන තන්ත්‍රයේ සුන්බුන්වලට ආගන්තුක වන්නේද නො වේ. බොහෝ ඉරාකීයයන්ගේ පමනක් නොව මැදපෙරදිග පුරාම ජනතාවගේ ද සහාය දිනාගනිමින්, එක්සත් ජනපදයේ විජිත පාලනය කෙරෙහි පුලුල්ව වැඩෙන විරුද්ධත්වය අවමංගත කිරීම සඳහා මෙම දෙකොටසම වැදගත් ක්‍රියාකලාපයක් ඉටුකර තිබේ.

බාත්වාදීන් හෝ ඉස්ලාමීය නියෝජිතයන්ගෙන් කවරෙකු වත් පීඩිතයන්ගේ හා කම්කරු පන්තියේ අවශ්‍යතාවන් නියෝජනය නො කරයි. අරාබි ලෝකය

පුරාම අනාගමික ධනේශ්වර ජාතිකවාදය මෙන් ම බාත් තන්ත්‍රය ද පාලක ප්‍රභූවේ අවශ්‍යතාවන් පෙරට ගෙනයාමේ දී ඉරාක ජනතාවගේ මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් මෙන්ම සමාජ අවශ්‍යතාවන් ද ඒ වෙනුවෙන් බිල්ලට දුන්හ. එම ව්‍යාපාර, මුලින් සහයෝග පතා සිටි අධිරාජ්‍යවාදී බලයේම ගොදුරක් බවට පත්විය.

ඉස්ලාම්වාදීන් තම සාර්ථකත්වය අත්කරගන්නේ මූලිකව ම ජාතික ධනේශ්වරයේ මෙම අසාර්ථකත්වයෙනි. 1980 ගනන්වල සෝවියට් සහාය ලත් ඇෆ්ගන් පාලන තන්ත්‍රයට ප්‍රහාර එල්ල කිරීමේ දී වොෂින්ටනය ඔවුන් වෙත සහයෝගය දැක්වූ අතර, ඉරාකය තුල ෂියාවරුන් අධිකාරය දරන රාජ්‍යයක් බිහිවීමට නොකැමති වූ සෞදි අරාබි පාලක ප්‍රභූවේ කොටස්වලට ද කලාපයේ අනෙකුත් පාලන තන්ත්‍රයන්හි ද, අඩුම තරමේ නිහඬ සහාය ඔවුහු භුක්තිවින්දාහ. ඔවුන්ගේ ම පටු අවශ්‍යතාවන්ට අධිරාජ්‍යවාදය තවදුරටත් සහාය දක්වන්නේ නම් බාත්වාදීන් මෙන්ම ඉස්ලාම්වාදීන් ද එය සමග ගනුදෙනුවකට සූදානම්ව සිටියහ.

ඉරාක සිවිල් වැසියන්ට එරෙහිව සාපරාධී මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර මගින් අපේක්ෂිත ප්‍රතිගාමී සමාජ අරමුනු නම් මේවා ය. ඉරාකයේ මුල්ලාවරුන්ගේ හෝ ඇෆ්ගනිස්ථානයේ තලිබාන්වරුන්ගේ මෙන් ප්‍රතිගාමී ඉස්ලාමීය මනෝරාජ්‍යයක් ඇටවීමට හෝ බාත්වාදී පාලනතන්ත්‍රයක් යලි ගොඩනැගීමට හෝ මහජන සහයෝගය දිනාගැනීමට මෙම එකදු බලවේගයක්වත් සමත්වන්නේ නැත.

ඉහත සඳහන් වූ ක්‍රමෝපායන් අධිරාජ්‍යවාදී ප්‍රකෝපකරනයක් හෝ වාර්ගික සිවිල් යුද්ධයක් ඇවිලවීමේ උත්සාහයක ප්‍රතිඵලය නොවන තාක් දුරට ඒවා පසුපස පවතින්නේ මෙම බලවේගයන්ගේ ද ඔවුන්ගේ දේශපාලන ක්ෂමාලාපකයන්ගේ ද ඉහවහා ගිය ප්‍රගාඪ අශුභවාදය යි. ඉරාක මහජනතාව දැනුවත්ව, දේශපාලනිකව බලමුලුගැන්වීමේ පදනම මත අධිරාජ්‍යවාදයට එරෙහි අරගලයට ඒකාබද්ධ කිරීමේ හැකියාව ඔවුහු එකහෙලාම ප්‍රතික්ෂේප කරති.

ත්‍රස්තවාදය කෙරෙහි සමාජවාදී ව්‍යාපාරයේ විරුද්ධත්වයට දිගු ඉතිහාසයක් හා බලගතු දේශපාලන පදනම් ඇත. ලෙනින්, ට්‍රොට්ස්කි හා 1917 ඔක්තෝබර් විප්ලවයේ අනෙකුත් නායකයන් සිය දේශපාලන ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනය කෙටුම්පත් කලේ නිසැකවම ත්‍රස්වාදී දේශපාලනයට එරෙහි අරගලය තුලය. ඔවුන් එවන් විධික්‍රමයන්ට විරුද්ධවූයේ වියුක්ත සදාචාරයේ දෘෂ්ටි ආස්ථානයෙන් නොව ඒවා කම්කරු පන්තියේ පාර්ශවයෙන් ස්වාධීන දේශපාලන අරගලය හා දේශපාලන සවිඥානකත්වයේ වර්ධනයට හරස්කැපීම පමනක් සිදු කල බැවින්ය.

,අපගේ දෘෂ්ටියට අනුව පුද්ගලත්‍රස්තවාදය පිලිගත නො හැක්කේ හරියට ම එමගින් නිසැකවම සිදු කරන්නේ මහජනතාවගේ භූමිකාව ඔවුන්ගේ ම විඥානය තුල ලඝු කොට දැක්වීමත් ඔවුන් ඔවුන්ගේ බලරහිතකම සමඟ ප්‍රතිසන්ධානගත කරවමින් ඔවුන්ගේ දෑස් හා බලාපොරොත්තු, යම් දිනෙක පැමින ඔහුගේ මෙහෙවර ඉටුකරන්නාවූ මහා පලියගන්නා ද විමුක්තිදායකයා ද වෙත යොමු කරන බැවින් ය,යි ට්‍රොට්ස්කි 1909 දී ,පුද්ගල ත්‍රස්තවාදයට මාක්ස්වාදීන් විරුද්ධවන්නේ මන්දැ,, යනුවෙන් ලියූ ලිපියෙහි සඳහන් කලේ ය.

ට්‍රොට්ස්කි හා ඔහුගේ සහෝදරවරු සටන්වැදුනේ සත්තකින්ම නිරායුධ හා දුගී ජනතාව තොගපිටින් අමුඅමුවේ ඝාතනය කිරීම සඳහා නොව රුසියානු සුලු ධනේශ්වර බුද්ධිමතුන්ගේ ස්ථරයක් විසින් ක්‍රියාවට නැගූ සාර්වාදී ඇමතිවරුන්ට එරෙහි ඝාතන උත්සාහයන්ගේ ස්වරූපය ගත්, ත්‍රස්තවාදයට එරෙහිව ය.

විජිත පාලනයකට යටත්කල රටක, අධිරාජ්‍යවාදයට එරෙහි අරගලය, ප්‍රචන්ඩ ස්වරූපයක් ගැනීම නොවැලැක්විය හැකි වුවද, හිල්ලා බොම්බ පිපිරවීම වැනි ක්‍රියාවන් මෙම අරගලය ශක්තිමත් කරනු ඇතැයි විශවාස කිරීම මංමුලා සහගත ද, ප්‍රතිගාමී ද වේ.

ඉරාකය යටත්කිරීමේ හා විජිතකරනයේ එක්සත් ජනපද උත්සාහයට එරෙහි අරගලයේ, තීරනාත්මක ප්‍රශ්නය වන්නේ, පොදු සමාජවාදී හා ජාත්‍යන්තරවාදී ක්‍රියාමාර්ගයක පදනම මත, කලාපය පුරා ද, ජාත්‍යන්තරව ද, වැඩකරන ජනතාවන් සමඟ එක්සත්වීමට සටන්වදින්නාවූ, ඉරාක කම්කරු පන්තියේ ස්වාධීන ව්‍යාපාරයක පැනනැගීමයි.

කම්කරුවන්ගේ බලගතු මහජන ව්‍යාපාරයක් හමුවේ එක්සත් ජනපදයට දේශපාලන බලය පවත්වාගෙන යා නොහැකි වනු ඇත. ලක්ෂ ගනන් ෂියාවරුන් 2004 මුලදී ඍජු මැතිවරන ඉල්ලා වීදිවලට බැසගත්විට, ඇමරිකානු යටත්විජිත බලධාරීන්ගේ ප්‍රතික්‍රියාව, උපදේශාත්මකය. මහජනතාව හමුවේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට පසුබැසීමට ද එහි සැලසුම් යලි සැකසීමට ද බලකෙරුනි.

මහජන බලමුලුගැන්වීමේ හැකියාව හමුවේ පවා, තමන් නිර්නාමික ප්‍රචන්ඩත්වයකට ගොදුරුවේ ය යි නිරන්තරව පවතින තර්ජනයක් මගින් එය දුර්වල කිරීම, බෝම්බ පිපිරවීමේ ව්‍යාපාරයෙහි දුෂ්ඨතම බලපෑම වේ.

ඉරාක වැඩකරන ජනතාවගේ අව්‍යාජ ස්වාධීන ව්‍යාපාරයක් පැනනැඟීම සිදුවිය හැක්කේ ඉරාක කම්කරු පන්තිය ඓතිහාසිකව පසුබස්වනු ලැබූවා වූ බලවේගයන්ට එරෙහි සම්මුති විරහිත අරගලයක් තුලින් පමනකි. මේ අතරට බාත් පාලන තන්ත්‍රයේ මැරයන් ද, අන්ත දේශපලන පසුගාමීත්වය පෝෂනය කලාවූ ආගම් පදනම්කර ගත් ව්‍යාපාරයන් ද, ඉරාක කම්කරුවන් මුහුනපා සිටින වර්තමාන උභතෝකෝටිකය සඳහා විශේෂයෙන් ම වගකීම දරා සිටින ඉරාක කොමියුනිස්ට් පක්ෂය ද ගැනේ.

ඉරාක කොමියුනිස්ට් පක්ෂ ස්ටැලින්වාදීන් නිරතුරුව රැඳී සිටියේ කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වයට එරෙහි වීමේ නොසැලෙන අධිෂ්ඨානයෙනි. 1963 සීඅයිඒ සංවිධානයේ සහාය ලත් කුමන්ත්‍රනයෙන් පසුව පක්ෂ සාමාජිකයන් දහස් ගනනක් ඝාතනය කිරීම නොතකා ම ඔවුහු බාත්වාදී පාලන තන්ත්‍රය තුලට ඇතුල්වූහ. 1978-79 වසරවල සදාම් හුසේන් ස්ටැලින්වාදීන්ට එරෙහිව දියත්කල ලේවැකි විරේකකිරීම දක්වා ම කොමියුනිස්ට් පක්ෂය ඔහු වැලඳ ගෙන සිටියේ ය. දැන් ඉරාක කොමියුනිස්ට් පක්ෂය එක්සත් ජනපද යටත්විජිත ග්‍රහනයේ සැබෑ සහායකයෙක් ලෙස, රූකඩ පාලනයට සම්බන්ධ වී එක්සත් ජනපදයේ සහාය ලත් වෘත්තීය සමිති සම්මේලනය ක්‍රියාත්මක කරන අතර, විජිත ග්‍රහනයට හෝ ඉරාක ආර්ථිකය තොග පිටින් පුද්ගලීකරනයට හෝ කිසිඳු අයුරකින් විරුද්ධ නො වෙති.

20 වැනි සියවසේ අධිරාජ්‍යවිරෝධී හා ජාත්‍යන්තර සමාජවාදී අරගලයන්ගේ ඓතිහාසික හා නිරන්තර ශෝචනීය අත්දැකීම් මත පදනම්ව, ඉරාක කම්කරු පන්තියේ නව දේශපාලන පක්ෂයක් ගොඩනැගිය යුතුව ඇත. ජාත්‍යන්තර ඉදිරිදර්ශනයක් මත පදනම් වූ කම්කරු පන්තියේ විප්ලවවාදී දේශපාලන පක්ෂයක් ගොඩනැගීමට වෙනත් විකල්පයක් ඇත්තේ නැත.

© www.wsws.org